බන්ධ/කො/ජනරාල් චක්‍ර ලේඛ අංක :- 13/2012

මගේ අංක :- එස්ඩබ්ඩී/05/නිල/අතිකාල/2012,
බන්ධනාගාර මූලස්ථානය,
කොළඹ 09.
2012.04.09

බන්ධනාගාර මූලස්ථානයේ මාණ්ඩලික නිලධාරීන් ඇතුළු,
සියළුම බන්ධනාගාර ආයතනභාර අධිකාරී/සහකාර අධිකාරීන් වෙත.

**<u>බන්ධනාගාර නිලධාරීන්ට 2012 වසර සඳහා අතිකාල දීමනා ගෙවීම.</u>**

බන්ධනාගාර සේවයේ දෛනිකව සිදුකරන රාජකාරි ස්වභාවය හා නිලධාරීන් විසින් අඛණ්ඩව ඉටුකරන භාරදූර කාර්යයන් පිළිබඳව පූර්ණ විශ්ලේෂණයක් කිරීමෙන් පසු බන්ධනාගාර නිලධාරීන් සිදුකරන අමතර සේවා කාලය සඳහා 40% සීමාවට යටත්ව පැය 96 ක උපරිමයක් හා සමස්ත නිලධාරීන්ගෙන් 9% ක් විසින් සිදුකරන අමතර අත්‍යාවශ්‍ය රාජකාරි කටයුතු සඳහා 60% සීමාවෙන් පැය 144 ක උපරිමයකට යටත්ව අතිකාල ගෙවීමටත් අනුමැතිය ලබාදෙන අතර, ඉදිරියේ දී එම ගෙවීම් පහත සඳහන් කොන්දේසි වලට යටත්ව සිදු කිරීමට ආයතන භාර අධිකාරී/සහකාර අධිකාරීන් වගබලා ගත යුතුය.

- 2012 ජනවාරි මස සිට දෙසැම්බර් මස දක්වා මෙම ගෙවීම සිදුකිරීම බලාත්මක වේ.
- 2012 වසරේ සියළුම බන්ධනාගාර ආයතනවල නිලධාරීන් විසින් මාසිකව සිදුකරන ලද අමතර අත්‍යාවශ්‍ය සේවාවන් පිළිබඳ පූර්ණ සමීක්ෂණයක් කිරීමෙන් පසු ඒ ඒ ආයතන වල නිලධාරීන් සඳහා උපරිම වශයෙන් ගෙවිය හැකි පැයගණන ගණනය කර ඇති අතර, ආයතනයට අදාලව වෙන්කර ඇති සීමාව තුල එම ගෙවීම් සිදු කිරීමට ආයතන භාර අධිකාරී/සහකාර අධිකාරීවරුන් වගබලා ගත යුතුය.
- ආයතන වල සිදුකරන අමතර විශේෂිත රාජකාරි වෙනුවෙන් මසකට 60% සීමාව යටතේ වෙන්කර දී ඇති පැයගණන හුදෙක්ම එම මස ඇතුලත සිදුකරන අමතර සේවා කාලය සඳහා පමණක් වලංගු වේ. එසේ හැරුණුවිට එම මාසයතුල වෙන්කල පැය ගණනේ ඉතිරියක් වේ නම් එය ඉදිරි මාසයේ හෝ වෙනත් මාසයක් සඳහා යෙදවීම කිසිසේත් නොකල යුතුය.
- යම් විශේෂිත කටයුත්තක් හෝ විශේෂ හදිසි අවස්ථාවක් වෙනුවෙන් නිලධාරී සේවය ලබාගැනීමට සිදුවුවහොත් උදා : බන්ධනාගාර ආයතනවල සිදුවන කැරැල්ලක්, කෝලාහලයක්, ස්වභාවික ව්‍යසනයන් හා හදිසි අවස්ථාවක ගිනි ගැනීමක් ආදී හදිසි තත්වයක් උද්ගතවූ විට ලබාගන්නා අමතර සේවය විශේෂ අවස්ථාවක් ලෙස සලකා, ඒ සඳහා පූර්ව අනුමැතියක් ලබාගැනීමෙන් පසු ගෙවීම් කිරීමට ආයතන භාර අධිකාරී/සහකාර අධිකාරීවරුන් වගබලා ගත යුතුය.
- දෙපාර්තමේන්තුවේ දැනට සිටින නිලධාරී සංඛ්‍යාවට අනුව ඉහත සීමාවන් යටතේ ගෙවීම් කිරීමට හැකිවන නමුත් දෙපාර්තමේන්තුවේ පවතින පුරප්පාඩු පිරවීම හෝ අනුමත සේවක සංඛ්‍යාවේ වෙනසක් සිදුවුවහොත් ඒ අනුව ඉදිරියේ දී මෙම ගෙවීම්ද වෙනස්වනු ඇත.

සෑම මසකම පැය 96 න් ඔබ්බට පැය 144 සීමාව දක්වා ගෙවීම් කලයුතු නිලධාරීන්ගේ නාමලේඛනයක් සහිතව පහත වගුවේ දැක්වෙන පරිදි සවිස්තර වාර්තාවක් බන්ධනාගාර මූලස්ථාන නිලධාරී සුභසාධක හා සංවර්ධන අංශයට එවීමටත්, ඒ අනුව ගෙවීම් සඳහා පූර්ණ අනුමැතිය ලබාගැනීමටත් කටයුතු කල යුතුවේ. පසුගිය මාසයේ අනුමැතිය ලබා ගැනීමෙන් තොරව ඉදිරි මාසවල ගෙවීම් නොකිරීමට ආයතන භාර අධිකාරී/සහකාර අධිකාරීවරුන් වගබලා ගත යුතුය.

ආයතනයේ නම :-

| අනු අංකය | තනතුර | නිලධාරියාගේ නම | මාසය | | එකතුව | |
|---|---|---|---|---|---|---|
| | | | අතිකාල පැය | ගෙවිය යුතු මුදල | අතිකාල පැය | ගෙවිය යුතු මුදල |
| | | | | | | |
| | | එකතුව | | | | |

පී.ඩබ්ලිව්.කොඩිප්පිලි.
බන්ධනාගාර කොමසාරිස් ජනරාල්.